ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
නිවාඩු කාලීන පාසල-2020 මාර්තු/අප්‍රේල්
ඉතිහාසය
07ශ්‍රේණිය__ප්‍රශ්නපත්‍ර 04

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා හිස්තැනට ගැලපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

(සීගිරිය/ගෝත්‍ර/තැප්‍රොබේන්/සුභ/හැලිකටා)

1. පළමුවන කාශ්‍යප රජතුමා විසින් කර වූ ............................ ලෝක උරුමයකි.
2. ග්‍රීකවරුන් ශ්‍රී ලංකාව ............................ නමින් හැඳින්වීය.
3. යාපහුව කඳු මුදුනෙහි බලකොටුවක් තනාගෙන සිටි ................................. සෙනවි ප්‍රාදේශීය පාලකයෙකි.
4. මුල් කාලයේදී රෝමයේ ....................... හෝ පවුල් පදනම් කර ගත් පාලනයක් පැවතුනි.
5. හිසට වළඳක් නමා සාදා ගන්නා ලද පඹයා....................... ලෙස හැඳින්වේ.

ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා හරි නම් හරි (√) ලකුණ ද වැරදිනම් (x) ලකුණ ද යොදන්න.

6. අතීතයේ ගෝකණ්ණ නමින් හැඳින්වූයේ අද ත්‍රිකුණාමල වරායයි. ( )
7. භාණ්ඩයකට භාණ්ඩයක් හුවමාරු කර ගැනීමේ ක්‍රමය අප සමාජය තුළ අතීතයේදී පැවතුනි. ( )
8. සංස්කෘත භාෂාවේ අශ අදෙක ලෙස හැඳින්වූයේ ඇතුන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියායි. ( )
9. පොලොන්නරුවේ පිහිටි නිශ්ශංකමල්ල රාජ සභා මණ්ඩපය පුරා විද්‍යාත්මක මූලාශ්‍රයකි. ( )
10. පැරණි හින්දු පොත්පත් වල නාමකරණ ලෙස හැඳින්වූයේ කන් විදීමේ උත්සවයයි. ( )

ප්‍රශ්න අංක 11 – 15 දක්වා ගැළපෙන ලෙස A හා B යා කරන්න.

| A | B |
|---|---|
| 11. ක්‍රි.ව. 1215 | A ඇපනයින් කඳුවැටිය |
| 12. ආර්ය චක්‍රවර්ති | B සකපෝරුව |
| 13. ඉතාලිය | C උඩුපිල |
| 14. මැටි කර්මාන්තය | D කාලිංග මාඝ |
| 15. වෙස් මුහුණු කලාව | E විජය කුලංගෙ |
| | F ගම් ලද්දන් |

ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා නිවැරදි පිළිතුරු අංකය වරහන තුළ ලියන්න.

16. කාලිංග මාඝ පරාජය කිරීම , චන්ද්‍රබානු රජුගේ පළමු,දෙවන ආක්‍රමණය පරාජය කිරීම කල දඹදෙනි පාලකයා

1. III වන විජයබාහු රජතුමා
2. IV වන පරාක්‍රමබාහු රජතුමා
3. II වන පරාක්‍රමබාහු රජතුමා
4. II වන බුවනෙකබාහු රජතුමා ( )

17. ග්‍රීසියේ ඇතැන්ස් රාජ්‍යයේ ස්වර්ණමය යුගය උදා කළ පාලකයා වන්නේ.

1. පෙරික්ලීස්
2. ජුලියස් සීසර්
3. පිලිප් රජු
4. හෙරඩෝටස් ( )

18. මහාවංසයේ කියැවෙන ආකාරයට රුවන්වැලි සෑයට මුල්ගල තැබීමේ උත්සවයට දිව්‍ය කන්‍යාවන් වැනි නාටිකාවන් සහිතව පැමිණි රජතුමා

1. වසභ රජතුමා
2. දුටුගැමුණු රජතුමා
3. මුගලන් රජතුමා
4. ධාතුසේන රජතුමා ( )

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

19. ගම්පොළ යුගය අවසානයේ ලංකාව ආක්‍රමණය කල චීන සෙන්පතියා

1. ඉබන් බතූතා 3. පාහියන් භික්ෂුව
2. මාර්කෝ පෝලෝ 4. චෙං හෝ ( )

20. අතීතයේදී මෙරට අකලහස , මදහස, පිටදඩහස යනුවෙන් කන්න තුනක් පැවති බව කියැවෙන සෙල් ලිපිය

1. අඹගමුව සෙල්ලිපිය 3.මහාවංසය
2. ගල්පොත සෙල්ලිපිය 4. තෝනිගල ශිලා ලිපිය ( )

## II කොටස

දී ඇති ප්‍රශ්න අතරින් ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

1. අතීතයේ මෙරට ජීවත් වූ ජනතාව විවිධ වෘත්තීන්වල නිරත වූ බවට සාධක හමුවේ. පැරැන්නන්ගේ ජීවන රටාව තීරණය වුයේ ඒ අනුවය.

I. පැරණි මිණිසාගේ ජීවන රටාවේ ප්‍රධාන ක්ෂේත්‍ර තුන නම් කරන්න.

II. අ. හේන්වල වගා කල ඇල් වී වර්ග දෙකක්
ආ. කටුසර භෝග වර්ග දෙකක් ලියන්න.

III. ශ්‍රී ලංකාවෙන් වෙනත් රටවල් ගෙන ගිය භාණ්ඩ වර්ගයක් හා වෙනත් රටවලින් ලංකාවට ගෙන් වූ භාණ්ඩයක් නම් කරන්න.

2. අනුරාධපුර හා පොළොන්නරු යුගවල ශ්‍රේෂ්ඨ පාලකයන් සිටි බව පෙනේ. විවිධ ආක්‍රමණවලට මුහුණ දෙමින් මෙරට රැකගත් බව පෙනේ.


I. අනුරාධපුර යුගයේදී රජකම උරුමවීමේ ආකාර දෙක නම් කරන්න.

II. පහත රජවරු සමාජ සුභසාධනයට කල කාර්යය බැගින් ලියන්න.

- බුද්ධදාස රජතුමා -
- I උපතිස්ස -
- I උදය -
- V කාශ්‍යප -

III.

අ) අනුරාධපුර යුගයේදී අප රටට බලපෑම් කල දකුණු ඉන්දීය රාජ්‍යන් 3ක් සිතියමෙහි ABC ලෙස දැක්වේ. ඒවා නම් කරන්න.




UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

ආ) ඉහත ආක්‍රමණ ජයගත් පළමු විජයබාහු රජතුමාගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.

03. අතීත මුතුන් මිත්තන් විසින් සාදන ලද මූර්ති ගොඩනැගිලි, වැව් අමුණු ආදිය මෙරට සංස්කෘතිය විදහා පායි.

I. අපරටින් හඳුනා ගත හැකි ස්පෘශ්‍ය උරුම තුනක් නම් කරන්න.

II.



අ. මෙම පින්තූරයේ දැක්වෙන්නේ කුමක්ද?

ආ. එය මුහුදු මට්ටමේ සිට කොපමණ උසකින් පිහිටියේද?

ඇ. මෙය කොතරම් කාලයක් පැරණි ද?

ඈ. කැනීම් කල පුරා විද්‍යාඥයකු නම් කරන්න.

III. අපේ සංස්කෘතික උරුම විනාශ වන ආකාර 2ක් හා එම උරුමයන් රැක ගැනීමට ඔබ කැමති යෝජනා තුනක් සඳහන් කරන්න.

04. වසර 1500 පැවති අනුරාධපුර රාජධානියත් වසර 150 පැවති පොළොන්නරු රාජධානියත් රජරට ශිෂ්ටාචාරයට අයත්ය. මාඝ ආක්‍රමණයත් සමඟ මෙම රාජධානී බිඳ වැටේ.

I. රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු බිහි වූ රාජධානී තුනක් නම් කරන්න.

II. පහත රජවරු රජකල රාජධානිය ලියන්න.

අ. III විජයබාහු -
ආ. I බුවනෙකබාහු -

ඇ. IV බුවනෙකබාහු -
ඈ. විජය කුලංගෙ -

III. කෝට්ටේ යුගය සිංහල සාහිත්‍යයේ දියුණුම යුගයයි. බිහි වූ පොත්පත්, පිරිවෙන්, ගිහි පැවිදි උගත්තු ඇසුරින් බිත්ති පුවත්පතකට ලිපියක් ලියන්න.

05. ඕනෑම රටක් තම රටටම සුවිශේෂ වූ සංස්කෘතික උරුම හඳුනාගෙන ඇත. එම උරුම එම රටෙහි අනන්‍යතාවයයි.

I. පිළිතුරු ලියන්න.
අ. සංස්කෘතික උරුම ලෝක උරුම බවට පත් කරන ආයතනය -
ආ. ක්‍රි.ව. 2011 වන විට ලංකාවෙන් හඳුනාගෙන ඇති උරුම ගණන -

II. පහත ලෝක උරුම පිහිටා ඇති රට ලියන්න.
අ. පැරණි මොහෙන්දජාරෝ නගරය -
ආ. චීන මහා ප්‍රාකාරය -
ඇ. ගාලු කොටුව -
ඈ. ටජ් මහල -

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

III. මෙරට සම්ප්‍රදායික කලා ශිල්පවලට උදාහරණ තුනක් ලියා කෙටියෙන් පහදන්න.

06. අතීත මිනිසා ජීවත් වීමේදී කෘෂිකර්මාන්තය, කර්මාන්ත හා වෙළඳාමේ යෙදී ඇත. ඔවුන්ගේ ජීවන වෘත්තිය තීරණය වුයේ ඒ අනුවය.

I. පහත වචනවල අර්ථය ලියන්න.

අ. කිරිගෙරි -
ආ. පූග -
ආ. මධුපාචිකා -

II. පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය සැලසුම් කිරීමේදී ඉටු කල කාර්යයන් දෙකක් ලියන්න.

III. අතීත සමාජයේ පැවති යහපත් සිරිත් විරිත් පිළිබිඹු වන පහත අවස්ථා ඇසුරින් කෙටි විස්තරයක් කරන්න.

අ. අත්තම් ක්‍රමය ආ. විවාහය

07. ලෝකයේ පැවති ශිෂ්ටාචාර අතර ග්‍රීක රෝම ශිෂ්ටාචාරවලට වැදගත් තැනක් හිමිය. ඒ නූතන යුරෝපා ශිෂ්ටාචාර පෝෂණය ලැබුයේ ඉන් බැවිනි.

I. ග්‍රීකයේ පැවති නාට්‍ය වර්ග දෙක නම් කරන්න.

II. අ. ග්‍රීක දාර්ශනිකයන් දෙදෙනෙකු
ආ. රෝම හිෂ්ටාචාරයේ පාලකයින් දෙදෙනෙකු නම් කරන්න.

III. ග්‍රීක ජන ජීවිතය හා රෝම ජන ජීවිතය අතර වෙනස ලියන්න.

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION